ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව** |
| දිනය | **2015 ජුනි 02** |

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ එක්සත් ජනපද ඩොලර් මිලියන 650.0 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලංකාව) වෙනුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව වසර 10 ක පරිණත කාලයක් සහිත එක්සත් ජනපද ඩොලර් මිලියන 650.0 ක වටිනාකමින් යුත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සාර්ථක ලෙස දියත් කර වාර්ෂිකව සියයට 6.125 ක ඵලදා අනුපාතිකයකට මිල කරන ලදී.

මෙය, 2007 වසරේ සිට ජාත්‍යන්තර වෙළෙඳපොළට ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කළ එක්සත් ජනපද ඩොලර්වලින් සමන්විත අටවන පාදක බැඳුම්කර නිකුතුවයි. මෙම ගනුදෙනුවේදී සිටිගෘෘප් ග්ලෝබල් මාර්කට්ස්, ඩොයිෂ් බැන්ක්, ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් සහ ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැන්ක් යන ආයතන ඒකාබද්ධ නියමු කළමනාකරුවන්/ඒකාබද්ධ ගනුදෙනු පවත්වන්නන් ලෙස කටයුතු කළහ.

ෆිච් රේටින්ග්ස්, මූඩීස් ඉන්වෙස්ටර්ස් සර්විස් සහ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් යන ශ්‍රේණිගත කිරීම් ආයතන විසින් මෙම නිකුතුව පිළිවෙළින් ‘BB-’, ‘B1’ සහ ‘B+’ ලෙස ශ්‍රේණිගත කරන ලදී. මෙම නිකුතුව 2015 මැයි 28 වෙනි දින උදෑසන දී ආසියානු වෙළෙඳපොළට වාර්ෂිකව සියයට 6.375 ක පොලියක් පිරිනැමෙන මිල මඟ පෙන්වීමක් යටතේ ප්‍රකාශයට පත් කරන ලදී. මේ සඳහා ඇණවුම් ලැබීම ක්‍රමිකව ඉහළ යන ලද අතර ඒ අනුව අදාළ ස්වෛරීත්ව බැඳුම්කර ඵලදා අනුපාතිකය සියයට 6.125 ක් සහිතව එනම් 10 අවුරුදු එක්සත් ජනපද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා සමකාලීන වෙළෙඳපොළේ පිරිනැමෙන ඵලදා අනුපාතිකයට පාදාංක 397.7 ක් ඉහළ වූ අගයක් සහිතව නිකුත් කරන්නට හැකි විය. මූලික මිල මඟ පෙන්වීමට වඩා පාදාංක 25 ක සම්පීඩනයක් සහිතව මෙම බැඳුම්කර නිකුත් කිරීමට හැකියාව ලැබීම තුළින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර බැඳුම්කර මත ආයෝජකයන් විසින් ගොඩනගා ඇති අඛණ්ඩ විශ්වාසය පිළිඹිබු වේ.

ඇණවුම් ලැබීම අවසානයේ දී 3.08 වාරයක අධි දායකත්ව අනුපාතයක් සහිතව, එක්සත් ජනපද ඩොලර් බිලියන 2.0 ක ඇණවුම් ප්‍රමාණයක්, ගිණුම් 173 ක් යටතේ ලැබිණ. ඒ අතර ආසියාව තුළ සියයට 23 ක ප්‍රමාණයක්, යුරෝපය තුළ සියයට 27 ක ප්‍රමාණයක් සහ එක්සත් ජනපදය තුළ සියයට 50 ක ප්‍රමාණයක් ලෙස මෙම ඇණවුම් මනා ලෙස විසිරී පැවතිණි. සියයට 79 ක ප්‍රතිශතයක් නියෝජනය කරමින් ගෝලීය අරමුදල් කළමනාකරුවන් මෙම ගනුදෙනුවේ ප්‍රධානතම ආයෝජකයන් වූ අතර, බැංකු විශ්‍රාම/රක්ෂණ අරමුදල් සහ පෞද්ගලික බැංකු පිළිවෙලින් සියයට 9, සියයට 7 හා සියයට 5 ප්‍රමාණයකට දායක විය.

නව රජය යටතේ සිදු කරන ලද පළමුවන ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව මෙන්ම 2015 වසරේ සිදු කරන ලද පළමුවන ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව ලෙස මෙම ගනුදෙනුව සැලකෙන්නේය. මින් පෙර 2012 වසරේ දී ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන්නට යෙදුනු 10 අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කර හා සැසඳීමේ දී සමකාලීන එක්සත් ජනපද 10 අවුරුදු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලැබෙන පොලී අනුපාතිකයට වඩා අඩු වෙනසකින් යුතුව මෙවර නිකුතුවේ ඵලදා අනුපාතිකය පවත්වා ගැනීමට හැකිවීම තුළින් මෙම නිකුතුවේ සාර්ථකත්වය පැහැදලි වන අතර එය හරහා ශ්‍රී ලංකා බැඳුම්කර වෙත එතෙක් දස අවුරුදු කල්පිරීමක් වෙනුවෙන් ද්විතියික වෙළෙඳපොළ තුළ පැවතේ යැයි සැලකිය හැකි පිරිවැයකට වඩා අඩු මට්ටමක් සහතිව අරමුදල් රැස්කර ගැනීමට අවස්ථාව උදා විණි. මෑතදී එක්සත් ජනපද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුන් හා බැඳි පොලී අනුපාතිකයන් හි සිදුවූ අස්ථාවරත්වය මෙන්ම මෙම වසර අවසානයේ දී අපේක්ෂිත එක්සත් ජනපද පොලී අනුපාතිකයන්ගේ ඉහළ යාම ඉදිරියේ මෙම ප්‍රතිඵලයන් ළඟා කර ගැනීමට හැකි වීම වඩාත් ආකර්ෂණීය වේ.